වාර්ෂික වාර්තාව

ஆண்டு அறிக்கை

Annual Report 2023



LAKSALA
State Gift & Souvenir Boutique

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

இலங்கை கைப்பணிப் பொருட்கள் சபை

Sri Lanka Handicrafts Board



වාර්ෂික වාර්තාව 2023

ලක්සල

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

පටුන

		පිටු අංකය
01)	ආයතනික තොරතුරු	**01**
02)	ලක්ඝල ප්‍රදර්ශනාගාර ජාලය	**02**
03)	දැක්ම සහ මෙහෙවර	**03**
04)	කාර්යය සමාලෝචනය සහ මෙහෙයුම් සමාලෝචනය	**04 - 10**
05)	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්	**11**
06)	ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කණ්ඩායම	**12**

මූල්‍ය වාර්තා

07)	වර්ෂය පිළිබඳ සංක්ෂිප්තය	14
08)	විස්තීරණ ආදායම් ප්‍රකාශය	15
09)	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	16
10)	කොටස් හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය	17
11)	මුල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	18
12)	මුල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	19-36
13)	විගණකාධිපති වාර්තාව	37-46

ආයතනික තොරතුරු

ආයතනයේ නම

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය- ලක්සල

ව්‍යවස්ථාපිත ස්වභාවය

"**1982** අංක **35** දරණ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධිත ආයතන පනත" යටතේ

ප්‍රධාන කාර්යාලය

අංක : 215, බෞද්ධාලෝක මාවත, කොළඹ 7

දුරකථන : 011 2557132 / 011 2055501

ෆැක්ස් : 011 2594872

අලෙවි විමසීම්

ඊ-මේල් : info@laksala.gov.lk

වෙබ් අඩවිය : *www.laksala.gov.lk*

අලෙවි තොරතුරු

දුරකථන : 011 2597797
ඊ-මේල් : info@laksala.gov.lk

විගණනය

විගණකාධිපති දෙපාර්තමේන්තුව

බැංකු

ලංකා බැංකුව

මහජන බැංකුව

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

ලක්සල ප්‍රදර්ශණාගාර ජාලය

	ලිපිනය	දුරකථන අංකය
1.කොටුව	අංක. **60,** යෝක් වීදිය, කොළඹ **01**.	**011-2323514**
2.තුම්මුල්ල	අංක.**215,** බෞද්ධාලෝක මාවත,තුම්මුල්ල, කොළඹ **07.**	**011-2580579**
3.නුවර	අංක.**05,** සංඝරාජ මාවත, නුවර.	**081-2222087**
4.කටුබැද්ද	අංක.**282,** ගාලු පාර, කටුබැද්ද මොරටුව.	**011-2605600**
5.බත්තරමුල්ල	අපේ ගම, පැලවත්ත, බත්තරමුල්ල.	**011-2786026**
6. ගාල්ල	අංක.**74/1,** සමුද්‍ර මාවත, ගාල්ල.	**091-2222783**
7.පින්නවල	අලි අනාථාගාරය, පින්නවල.	**035-2265015**
8.පේරාදෙණිය	අංක.**14,** උද්භිද උද්‍යානය, පේරාදෙණිය.	**081-2389253/63**
9.කටුනායක	**54** ඩී, සංක්‍රමණික වෙන්ව යාමේ කලාපය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල, කටුනායක.	**011-2260167**
10.නුවරඑළිය	අංක. 79 පරණ උඩුපුස්සැල්ලාව පාර, නුවරඑළිය.	052-2234445

අපේ දැක්ම

ශ්‍රී ලංකාවේ ත්‍යාග සහ සමරු භාණ්ඩ වෙළඳපල ප්‍රමුඛයා බවට පත්වීම.

අපේ මෙහෙවර

ත්‍යාග සහ සමරු භාණ්ඩ ක්ෂේත්‍රය තුළ වර්ධනීය අවස්ථා පුළුල් කරමින් සහ සංචාරක කර්මාන්තයට උසස් වටිනාකම් එකතු කළ දායකත්වයක් සපයමින් ග්‍රාමීය නිපැයුම්කරුවන් හට පුළුල් වෙළඳපල අවස්ථා විවර කරමින් සමාජ වගකීම ඉටුකරන වාණිජ වශයෙන් සඵලදායී ආයතනයක් බවට පත්වීම

.

අපේ කේන්ද්‍රීය වටිනාකම්

- තත්ත්වය, විශ්වාසනීයත්වය සහ මුදලට වටිනාකම.
- විවිධ වූ මානයන්ගෙන් යුක්තව හොඳම පාරිභෝගික තේරීම උදෙසා අවස්ථා සම්පාදනය.
- ග්‍රාමීය ප්‍රජාව අතර වටිනාකම් නිර්මාණය සහ වටිනාකම් හුවමාරුව.
- පාරිභෝගිකයා උපරිම ලෙස තෘප්තිමත් කිරීම.

තිරසර සංවර්ධන ඉලක්ක


- **2030** වසර වනවිට දේශීය සැපයුම්කරුවන්ගෙන් මිලට ගනු ලබන නිපැයුම් ප්‍රමාණය දෙගුණ කරමින් දේශීය නිර්මාණ ප්‍රවර්ධනය.
- **2030** වසර වනවිට ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ළඟා කරගැනීමේ අරමුණින් ලක්සල වෙත භාණ්ඩ සපයන කාන්තා සැපයුම්කරුවන්ගේ මුළු සංඛ්‍යාව **50%** කින් වර්ධනය කිරීම.
- විශේෂ අවශ්‍යතා ඇති ප්‍රජාව දිරිගැන්වීම පිණිස **2030** වසර වනවිට විශේෂ අවශ්‍යතා ඇති සැපයුම්කරුවන්ගේ සංඛ්‍යාව **25%** කින් වර්ධනය කිරීම.




දේශීය අත්කම් නිපැයුම්කරුවන් හට දේශීය මෙන්ම විදේශීය වෙළඳපල අවස්ථා විවර කිරීමේ අරමුණින් **1964** වසරේදී ලක්සල ආයතනය ස්ථාපිත කරන ලද අතර **1982** අංක **35** දරණ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන පනත යටතේ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වශයෙන් එය සංස්ථාපිත කරන ලදී. මෙකී ක්ෂේත්‍රය තුළ මේ වන විට ලක්සල රජය සතු පැරණිතම සහ විශාලතම ජාලය බවට පත්ව තිබේ.

මූල්‍ය කාර්යසාධන සාරාංශය

2023 සමාලෝචන වර්ෂය තුළ ලක්සල මුළු පිරිවැටුම රුපියල් 641,276,597.00 ක් වාර්තා කර ඇති අතර එහි විකුණුම් පිරිවැය රුපියල් 245,826,257.00 කි. පහත ප්‍රස්ථාරයෙන් දැක්වෙන්නේ පසුගිය වසර පහ තුළ ලක්සල සමස්ත විකුණුම්වල සාරාංශයයි.




2023 වර්ෂය තුළ විකුණුම් විශ්ලේෂණයේදී තුම්මුල්ල ලක්සල ප්‍රදර්ශනාගාරය රුපියල් 314,244,629.00 ක් වූ අලෙවියක් සිදු කර විකුණුම් සඳහා ප්‍රධාන දායකත්වය ලබා දී ඇති අතර පිලිවෙලින් විකුණුම් පිරිවැටුම රුපියල් 74,964,140.00ක් හා රුපියල් 55,717,125.00ක් වාර්තා කරමින් පේරාදෙනිය ලක්සල ප්‍රදර්ශනාගාරය හා ගාල්ල ලක්සල ප්‍රදර්ශනාගාරය 2023 වසරේ විකුණුම් ආදායමට ඉහළ දායකත්වයක් ලබා දී ඇත.




මිලදී ගැනීම් විශ්ලේෂණය

2023 වර්ෂය තුළ ලක්සල විසින් රුපියල් 327,235,872.50 ක වටිනාකමකට වෙළඳ මිලදී ගැනීම් සිදු කර ඇත. පහත ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කරන්නේ පසුගිය වසර පහ තුළ වෙළඳ මිලදී ගැනීමේ ප්‍රවණතාවයයි.




පහත ප්‍රස්ථාරයෙන් අයිතම වර්ගීකරණයට අනුව 2023 වර්ෂයට අදාළ මිලදී ගැනීම් තවදුරටත් නිරූපණය කෙරේ. 2023 වෙළඳ මිලදී ගැනීම් විශ්ලේෂණය කිරීමේදී, වෙළඳ මිලදී ගැනීම්වලින් ඉහළ ප්‍රතිශතයක් කලා සහ අත්කම් අංශයෙන් නියෝජනය වේ.




වියදම් විශ්ලේෂණය

වියදම්	Y2022	Y2023
පරිපාලන වියදම්	218,216,410	253,942,587
බෙදා හැරීම් වියදම්	19,533,586	57,892,674
මූල්‍ය පිරිවැය	67,879,043	50,298,576
	305,629,039	**362,133,837**

පහත ප්‍රස්ථාර මගින් පෙර වසර හා සැසඳීමේ දී මුළු වියදම්වල සංයුතිය දක්වයි.





කාර්ය සාධන සමාලෝචනය - 2023 වර්ෂය

පසුබිම

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල 2023 වර්ෂයේ කාර්ය සාධන සමාලෝචනය සතුටින් ඉදිරිපත් කරමි. දේශීය හස්ත කර්මාන්ත නිර්මාණකරුවන් හට දෙස් විදෙස් වෙළඳපල අවස්ථා ඇති කරලීමේ අරමුණ පෙරදැරිව ලක්සල ආයතනය 1964 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභාව අනුබද්ධ ආයතන පනත යටතේ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වශයෙන් ස්ථාපිත කොට ඇත. ලක්සල මෙම ක්ෂේත්‍රයේ රජය සතු පැරණි සහ විශාලතම අලෙවි ජාලය බවට මේ වන විට පත්ව ඇත.

උපාය මාර්ගික ප්‍රවේශය,

ආරම්භ කරන ලද ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන් තුළින් තම පිරිවැටුම හා ලාභදායීත්වය මෙන්ම තිරසාර පැවැත්මක් සඳහා අත්‍යාවශ්‍ය, පාරිභෝගික ආකර්ෂණය වර්ධනය කරගත් අතර අවශ්‍යතාවයන්ට සහ ඉල්ලුමට සරිලන පරිදි අවශ්‍ය කටයුතු කිරීමට ගන්නා ලද ක්‍රියාමාර්ගයන් තවදුරටත් ශක්තිමත් කරන ලදී. එනම්,

- තම අලෙවිකරණ භාණ්ඩ කාණ්ඩ පුළුල් කරමින් නව වෙළඳපලක් ලබාගැනීම (Category Expansion).
- සන්නාමකරණය (Branding) තුලින් ආයතනයේ නාමය වෙළඳපළ තුළ ස්ථාපනය කිරීම.
- සංග්‍රහශීලී පාරිභෝගික සේවයකට අවශ්‍ය ආකාරයට සේවක මණ්ඩලය තුළ යහපත් ආකල්ප හා කුසලතා ගොඩනැංවීම.
- අන්තර්ජාලය හරහා ලක්සල භාණ්ඩ මිලදී ගැනීමේ පහසුකම් තව දුරටත් වර්ධනය කිරීම. (Online sales Facilities)
- ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය හා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය වැනි ආයතන හා පෞද්ගලික සංචාරක ආයතන සමඟ නිරතුරුව සම්බන්ධතා පවත්වා ගෙනයමින් ලක්සල ප්‍රදර්ශනාගාර සඳහා විදේශීය සංචාරකයින් ගෙන්වා ගැනීමේ කටයුතු සංවිධානය කිරීම.

ලක්සල වෙළඳනාමය යටතේ හඳුන්වා දෙන ලද ලක්සල ප්‍රදර්ශනාගාර තුල අලෙවි කරනු ලබන සියලුම භාණ්ඩ පෙළ තවදුරටත් පුළුල් කරන අතර ඒවා ගුණාත්මක හා උසස් තත්වයේ තෑගි හා සමරු භාණ්ඩ ලෙසින් දෙස් විදෙස් පාරිභෝගිකයන්ට පහසුවෙන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු තවදුරටත් පුළුල් කරනු ඇත. ඒ අනුව ඉතා උසස් තත්වයේ නවීන විලාසිතා වලින් අනූන භාණ්ඩ රාශියක් අලෙවිය සඳහා ප්‍රදර්ශනය කරන අතර ලක්සල ශ්‍රී ලංකාවේ තෑගි හා සමරු භාණ්ඩ අලෙවිකරණයේ එකම රාජ්‍ය හා ප්‍රධාන වාණිජ ආයතනයක් බවට දෙස් විදෙස් පාරිභෝගිකයන්ගේ හදවත් තුළ රඳවා තබා ගැනීමට අවශ්‍ය අලෙවිකරණ කටයුතු පුළුල් කොට පාරිභෝගිකයින්, ආයතනය කරා තව තවත් ආකර්ෂණය කර ගැනීම හා රඳවා තබා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

සන්නාමකරණය තුලින් ආයතනයේ නාමය වෙළඳපල තුළ ස්ථාපනය කිරීම.

ලක්සල තම අලෙවි ප්‍රදර්ශනාගාර වර්තමාන වෙළඳපොළට සරිලන ආකාරයෙන් ඉතා උසස් මට්ටමකට පත් කරන ලදී. ඒ අනුව ලක්සල ප්‍රදර්ශනාගාර නවීකරණය කර දෙස් විදෙස් පාරිභෝගික ආකර්ෂණය ඇතිවන පරිදි ඉතා ඉහළ මට්ටමකට පත් කිරීම මෙන්ම ලක්සල වෙළඳ නාමය යටතේ නිෂ්පාදන හඳුන්වා දෙමින් භාණ්ඩ ප්‍රදර්ශනය ඉහළ මට්ටමක පවත්වාගැනීම හා සන්නාමකරණය තුලින් අපේක්ෂිත අලෙවි ඉලක්ක සපුරා ගැනීමටද කටයුතු කරන ලදී.

සංග්‍රහශීලී පාරිභෝගික සේවාවකට අවශ්‍ය වන පරිදි සේවක මණ්ඩලය තුළ යහපත් ආකල්ප ගොඩනැංවීම.

පාරිභෝගික අවශ්‍යතා හඳුනා ගනීමින් ඔවුන් හට සංග්‍රහශීලි සේවයන් ලබා දීම සඳහා නව වෙළඳපොළට සරිලන ආකාරයට කටයුතු කළ හැකි සේවක මඩුල්ලක් පවත්වා ගැනීමට කටයුතු කිරීම සහ අවශ්‍ය නිසි පුහුණුව මෙන්ම පෙළඹවීම ඇති කිරීම තුළ ඔවුන්ගේ කාර්යක්ෂමතාවය ඉහළ මට්ටමක පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී. ඒ අනුව වැටුප් හා දීමනා ඔවුන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව මත සිදුකිරීම තුලින් ඔවුන්ගේ උනන්දුව වර්ධනය කිරීම, තවදුරටත් ආයතනයේ මූලික අරමුණු ඉටුකර ගැනීමට බොහෝ දුරට උපකාරී වී ඇත.

නිෂ්පාදන අයිතමයන් පුළුල් කිරීම

නව උපාය මාර්ගික වැඩ පිළිවෙළ යටතේ ආයතනයේ කාර්යයන් පමණක් නොව තම වෙළඳ භාණ්ඩ කාණ්ඩයන්ද පුළුල් කිරීම සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානය, ජාතික ශිල්ප සභාව සහ අනෙකුත් අදාල රාජ්‍ය ආයතන සමඟ එක්ව අවශ්‍යය පියවර ගන්නා ලදී. දේශීය නිෂ්පාදනවල අනන්‍යතාවය රැකගනිමින් වර්තමාන වෙළඳපළ අවශ්‍යතා සඳහා නව නිර්මණ ඉතා උසස් තත්වයෙන් යුතුව නිර්මාණය කොට වෙළඳපළට හඳුන්වා දීම හා මෙම තැගි සහ සමරු භාණ්ඩ කාණ්ඩයන්ට මැණික් සහ ස්වර්ණාභරණ, තේ, කුළු බඩු, සම් භාණ්ඩ, පිගන් භාණ්ඩ මෙන්ම දේශීය වෙස් මුහුණු සහ අනෙකුත් සමරු නිර්මාණ හඳුන්වා දුන් අතර ලක්සල නව නිර්මාණ අංශය විසින් ද නව අත්කම් නිපැයුම් හඳුන්වා දීම තුලින් තැගි හා සමරු භාණ්ඩ ක්ෂේත්‍රයේ නව නිර්මාණ රාශියක් එළි දැක්වීමට කටයුතු කරන ලදි.

සැපයුම් ජාලය

ලක්සල සැපයුම් ජාලය මගින් ප්‍රදර්ශනාගාරවල අලෙවි කිරීමට අවශ්‍ය තැගි හා සමරු භාණ්ඩ මිලදී ගැනීම මෙන්ම එම භාණ්ඩ නිෂ්පාදනය සැලසුම් කිරීම් තත්ව පාලනය හා නවීන මෝස්තර ලබා දීම ද ඇතුළත් වේ. **2022** වර්ෂයේ අවසන් වන විට ක්‍රියාකාරී සැපයුම්කරුවන් සංඛ්‍යාව **381** ක් පමණ වූ සමස්ත දේශීය හස්ත කර්මාන්ත ශිල්පීන් සංඛ්‍යාව මෙම වසර තුළ තවදුරටත් වර්ධනය වී ඇති අතර නව වෙළඳපළ අවස්ථා වැඩි දියුණු කිරීම තුළින් නව නිෂ්පාදකයින් හට මෙම ක්ෂේත්‍රය තුළට පිවිසීමට අවස්ථාවන් පුළුල් කරන ලදි.

පරිපාලනය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල සමස්ථ මෙහෙයුම් කටයුතු වලට අදාල අණපනත් , රාජ්‍ය වක්‍රලේඛ හා අනෙකුත් මූල්‍ය හා පරිපාලන උපදෙස් වලට අනුකූලව ක්‍රියාත්මක කරන ලද අතර යහපාලන හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුව කටයුතු කිරීමටද තහවුරු කරන ලදි. සංවිධානයේ ඉලක්ක හා පරමාර්ථ ලගාකර ගැනීම උදෙසා මෙන්ම අනෙකුත් සහායක සේවාන් සැපයීම පිනිස පරිපාලන සහ මානව සම්පත් අංශය සැලකිය යුතු කාර්යභාර්යයක් ඉටුකරන ලදී. අදාල සමාලෝචනිත වර්ෂය තුල කාර්යය මණ්ඩලය අදාල සමාලෝචිත වර්ෂය තුල කාර්ය මණ්ඩලය **88** කින් සමන්විත වන අතර එහි විස්තර පහත සඳහන් වේ.

2023/12/31 දිනට සමස්ථ කාර්ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ මට්ටම	05	
ද්විතික මට්ටම	07	
තෘතික මට්ටම	47	
ප්‍රාථමික මට්ටම	08	67
කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය		21
මුළු ගණන		88

පෙර වසර සමඟ සසඳා බැලීමේදී සමාලෝචිත වර්ෂය තුල කාර්ය මණ්ඩල ප්‍රමාණය 107 සිට 88 දක්වා අඩු වී ඇත. තරඟකාරී අලෙවි පරිසරය තුළ මනාලෙස සකසන ලද කොටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ව්‍යාපාර සැලසුම් ක්‍රියාත්මක කිරීම උදෙසා වන ප්‍රයත්නයේදී මනා ලෙස පුහුණුව ලද, කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් ගොඩනැංවීම යන්න තීරක කාර්යභාරයක් ඉටු කරයි.

අලෙවි කාර්ය මණ්ඩලය මෙන්ම සහාය කාර්ය මණ්ඩලය වෙත පුහුණු සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් සේවයේ ගුණාත්මකභාවය සහ ඵලදායීතාවය වර්ධනය කිරීමට පියවර ගනු ලැබිණි.

2023 වසරේදී විදේශීය සංචාරකයින්ගේ පැමිණීම යථාවත් වනු ඇතැයි අපේක්ෂා කරන හෙයින් ස්වයං මූල්‍යය වාණිජ ආයතනයක් ලෙස නව ව්‍යාපාරික සැලැස්මක් යටතේ අලෙවි කටයුතු තවදුරටත් වර්ධනය කිරීමට අවශ්‍ය සියලුම උපාය උපක්‍රම ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්

අංකය	අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන්ගේ නම්	පත්වීම් කාල සීමාව	
		සිට	දක්වා
1.	* රුෂාන් මාරඹගේ මයා	20.01.2023	වත්මන්
2.	ආර්.කේ.එල්. ජාගොඩ මිය	02.03.2022	වත්මන්
3.	ඩී. ජීවානාදන් මයා	09.10.2020	වත්මන්
4.	ඩබ්.ජී.කේ.බී රණතුංග මයා	02.05.2023	වත්මන්
5.	ඊ්.ඩී.සී.එස් ඇරැහැපොළ මයා	02.05.2023	වත්මන්
6.	ඒ.එල්.ඩී. නදීක කංචන මයා	02.05.2023	වත්මන්
7.	ජී.කේ.එන්.ආර්.යූ කුමාර මයා	02.05.2023	වත්මන්
8.	එන්.පී.ඒ.ආර්. ජයවර්ධන මිය	14.01.2020	02.05.2023
9.	සජිත් එම්. කොඩිකාර මයා	03.01.2020	02.05.2023
10.	කේ.එල්. මහින්ද සමරතුංග මයා	03.01.2020	09.01.2023
11.	මධුමාලී අල්විස් මිය (නීතිඥ)	03.01.2020	02.05.2023
12.	සංජීව ධර්මවර්ධන මයා	08.06.2021	02.05.2023

* අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස මෙන්ම ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල සභාපති ලෙස කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල

ජ්‍යෂ්ඨ කළමණාකරණ කණ්ඩායම - 2023

සී.එන්.දහනායක මහතා	**වැ.බ කළමණාකාර අධ්‍යක්ෂ/**අධ්‍යක්ෂ (මානව සම්පත් හා පාලන)
කේ.සී.ජයවර්ධන මහතා	අධ්‍යක්ෂ (විකුණුම්)
ඊ.ඇලන් ඩෙලිල්කන් මහතා	වැඩ බලන අධ්‍යක්ෂ (මුදල්)
සම්පත් සෙනෙවිරත්න මහතා	වැ.බ අධ්‍යක්ෂ (සැපයුම් ජාල සංවර්ධන)
වජීරා සමරරත්න මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)
දේවිකා කුමාරි අතුකෝරළ මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ (බෙදාහැරීම්)
ඒ.එල්.එම් රිස්වාන් මහතා	සහකාර අධ්‍යක්ෂ (ආදායම් හා වියදම්)
ගයාන් ලියනගේ මහතා	වැ.බ සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් හා පාලන)
දිනේෂ් අබේකෝන් මහතා	තොරතුරු තාක්ෂණ ඒකක ප්‍රධානී

අපේ කෘතඥතාව

පළමුව මම ලක්ඝල වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී, සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු කර්මාන්ත අමාත්‍යතුමා සහ ගරු කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා හට මහත් කෘතවේදීත්වය පුදදෙනු කැමැත්තෙමි. අප ආයතනය ක්ෂේත්‍රයෙහි ඉහලම ස්ථානයකට නංවාලනු පිණිස නිරතුරු ඇවැසි තීරණ සහ නිගමනයන් ලබාදීම සම්බන්ධයෙන් නිරන්තරයෙන් අවශ්‍ය තීන්දු තීරණ ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්හටද කෘතවේදීත්වය පුදනු කැමැත්තෙමි.

තවද, අවශ්‍ය සෑම අවස්ථාවකම අප ආයතනයේ ප්‍රගතිය උදෙසා ලබාදුන් සහය වෙනුවෙන් මම අප අමාත්‍යාංශයේ ලේකම්තුමාට කෘතවේදීත්වය පළ කර සිටිමි.

එමෙන්ම ආයතනයේ පරිපාලන, මූල්‍ය සහ අලෙවි කටයුතු සම්බන්ධයෙන් ඵලදායීව තම සේවක මණ්ඩලය මෙහෙයවූ අංශ ප්‍රධානීන්ට මෙන්ම ආයතනයේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වාගෙන යාමට දායකත්වය ලබාදෙන ලද අනෙකුත් සමස්ථ කාර්ය මණ්ඩලය වෙතද මාගේ ස්තුතිය පුද කරමි.

අප සමග අත්වැල් බැඳගනිමින් පාරිභෝගික අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන, නව නිපැයුම් හඳුන්වා දෙමින්, සම්ප්‍රදායික මෙන්ම නව්‍ය වූ නිපැයුම් ඇතුළුව අත්කම් සහ සමරු භාණ්ඩ සපයමින් අප හා එක්වූ නිපැයුම්කරුවන්ට මෙහිදී විශේෂ ස්තුතිය පුද කරනු කැමැත්තෙමි. එසේම සෑම අවස්ථාවකම අප ආයතනය මත විශ්වාසය රැඳවූ දේශීය මෙන්ම විදේශීය ගණුදෙනුකරුවෝද අපේ විශේෂ ස්තුතියට හිමිකම් ලබති.

අනාගතයේදී ශ්‍රී ලාංකික ග්‍රාමීය ආර්ථිකය සවිමත් කිරීමට සහ ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්වයන් නගා සිටුවීමට ඇවැසි සියළු පියවර අප ආයතනය මඟින් ගනු ලබන බව ප්‍රකාශ කරන අතරම ඉදිරි වසරවලදී අපගේ අලෙවිය රුපියල් බිලියනයක් දක්වා වර්ධනය කිරීමට අපේක්ෂා කරන බවද අවසන් වශයෙන් පවසමි.

තවද, ආයතනයේ මානව සම්පත මෙන්ම භෞතික සම්පත්ද ක්‍රමිකව කළමණාකරනය කිරීම හරහා සමස්ත කාර්ය මණ්ඩලයෙන්ම කාර්යක්ෂම සහ සඵලදායී දායකත්වය ලබාගනු පිණිස සකසන ලද උපායමාර්ගික සැලසුමකට අනුව ආයතනයේ පොදු කාර්ය පිරිවැය සැලකිය යුතු මට්ටමකින් පහත හෙලමින් **2024** වසර තුළ අපගේ ලාභ ප්‍රතිශතය වර්ධනය වන තත්වයක පවත්වා ගැනීමටද සැලසුම් සකස් කර ඇත.

සභාපති,

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය- ලක්ඝල

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

මූල්‍ය ප්‍රකාශන

2023 දෙසැම්බර් 31

2023

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

2023 වර්ෂය සඳහා ආදායම් විශ්ලේෂණය

<u>වර්ෂය පිළිබඳ සංක්ෂිප්තව - ගෝලීය සන්දර්භය සහ ශ්‍රී ලංකා ආර්ථිකය</u>


කොවිඩ්-19 වසංගතයෙන් පසු 2023 වසර සාර්ථක ප්‍රකෘතියක් සනිටුහන් කළ අතර, ශ්‍රී ලංකාව සංචාරකයින්ගේ පැමිණීමේ සැලකිය යුතු වැඩිවීමක් අත්විඳින ලදී. විශේෂයෙන් වසරේ තුන්වන සහ සිව්වන කාර්තුවල දී සිදු වූ සංචාරකයන් පැමිණීමේ වර්ධනය ලක්සල ආදායම ඉහළ නැංවීමට හේතු විය.

. 2023 ගිණුම්කරණ වර්ෂයේ දී ශ්‍රී ලංකාවට සංචාරකයින්ගේ පැමිණීමේ සිදු වූ වර්ධනයත් සමඟ, වසර කිහිපයකට පෙර ලක්සල ආයතනය, සිය ආදායම උපරිම මට්ටමක පැවති සමයේ අත්විඳිමින් සිටි අළෙවි රටා නැවත අත්පත් කර ගැනීම ආරම්භ කරන ලදී. කාර්තුමය අළෙවිය විශ්ලේෂණය කිරීමේදී අළෙවියේ වර්ධනය පැහැදිලිව දැකගත හැකි වූ අතර එය පළමු කාර්තුවේ සිට සෑම කාර්තුවකම පෙර කාර්තුවට වඩා වර්ධනයක් පෙන්නුම් කරන ලදී. වසර තුළ ධනාත්මක කාර්තුමය වර්ධනයන් පහත දැක්වේ.

<u>ලක්සල කාර්තුමය ආදායම – 2023</u>

1 වන කාර්තුව – රු.මි.119.9
2 වන කාර්තුව – රු.මි.127.5 — වර්ධනය **6%**
3 වන කාර්තුව – රු.මි.186.5 — **46%**
4 වන කාර්තුව – රු.මි.207.5 — **11%**

2008 සිට 2023 දක්වා වාර්ෂික අළෙවි දත්ත සහ 2023 වර්ෂයේ වර්ධනය ප්‍රස්ථාරයෙන් දැක්වේ.



රුපියල් මිලියන 641 ක විකුණුම් ආදායමක් අත්කර ගැනීමට ප්‍රධාන හේතුවක් වූයේ 2023 වසර පුරා රුපියල් මිලියන 307 ක වටිනාකමකින් යුත් වෙළඳ භාණ්ඩ අළෙවිය සඳහා මිලට ගැනීමයි.2023 දී ලක්සල අලෙවි ආදායම රුපියල් මිලියන 641 ක් වූ අතර එය 2022 වසරට සාපේක්ෂව 224% කින් සැලකිය යුතු ලෙස ඉහළ යාමකි. පරිපාලන වියදම් රුපියල් මිලියන 254 ක් වූ අතර එය රුපියල් මිලියන 36 ක (14%) වැඩිවීමක් වන අතර එය ආදායම් වැඩිවීම සමඟ සාධාරණීකරණය කළ හැකි වේ. 2023 සඳහා විකුණුම් සහ බෙදාහැරීමේ පිරිවැය රුපියල් මිලියන 57.8 ක් වූ අතර එය 2022 දී රුපියල් මිලියන 19.5 ට සාපේක්ෂව ආසන්න වශයෙන් 290% ක වැඩිවීමකි. 2023 වසරේ වියදම් වැඩිවීම 2023 දී ක්‍රමයෙන් ආදායම වැඩිවීම මත පදනම්ව වැඩි කරන ලද මෙහෙයුම් වියදම් සාධාරණීකරණය කරයි. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) වසර අවසන් කළේ රුපියල් මිලියන 57 ක බදු පෙර ලාභයක් සමඟිනි. මෙය රුපියල් මිලියන 99 ක අලාභයක් සිදු වූ 2022 වසරට සාපේක්ෂව විශාල වර්ධනයකි.

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශය
2023 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා

	සටහන්	2023 රු.	2022 රු.
ආදායම	**3**	641,276,597	283,623,048
විකුණුම් මිල		(245,826,257)	(113,608,044)
දළ ලාභය		**395,450,340**	**170,015,004**
ඉතුරුම් ගිණුම් සඳහා පොලී	**4**	70,513	68,432
වෙනත් ආදායම්	**5**	23,733,287	36,504,933
පරිපාලන වියදම්	**6**	(253,942,587)	(218,216,410)
විකිණීම් සහ බෙදා හැරීමේ වියදම්	**7**	(57,892,687)	(19,533,586)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ප්‍රතිඵල		**107,418,866**	**(31,161,627)**
මූල්‍ය පිරිවැය	**8**	(50,298,576)	(67,879,043)
බදුවලට පෙර ලාභය		**57,120,290**	**(99,040,670)**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
2023 දෙසැම්බර් 31 දිනට

	සටහන්	2023 රු.	2022 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත සහ උපකරණ	**09**	**687,635,857**	777,610,291
මුළු ජංගම නොවන වත්කම්		**687,635,857**	**777,610,291**
ජංගම වත්කම්			
භාණ්ඩ වට්ටෝරු	**10**	**524,015,737**	483,901,901
වෙළඳ සහ අනෙකුත් ලැබීම්	**11**	**83,130,903**	89,980,444
මුදල් සහ මුදලට සමාන දෑ	**12**	**59,202,624**	53,477,494
මුළු ජංගම වත්කම්		**666,349,264**	**627,359,839**
මුළු වත්කම්		**1,353,985,121**	**1,404,970,130**
හිමිකම් සහ බැඳීම්			
හිමිකම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය		**69,628,878**	69,628,878
ප්‍රාග්ධන සංචිත		**510,806**	510,806
ප්‍රත්‍යාගණන සංචිත		**454,366,157**	454,366,157
ප්‍රාග්ධන දීමනා		**107,951,172**	107,951,172
රඳවාගත් ඉපැයුම්		**(322,362,281)**	(281,916,107)
මුළු හිමිකම්		**310,094,732**	**350,540,907**
ජංගම නොවන බැඳීම්			
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්	**13**	**59,301,223**	57,679,530
විලම්බිත ආදායම	**14**	**-**	8,824,711
දිගු කාලීන ණය ගැනීම්	**15**	**419,491,154**	374,306,377
මුළු ජංගම නොවන බැඳීම්		**478,792,377**	**440,810,618**
ජංගම බැඳීම්			
වෙළඳ සහ අනෙකුත් ගෙවීම්	**16**	**535,004,994**	456,650,784
ගෙවිය යුතු ආදායම් බදු		**20,398,486**	21,798,486
කෙටි කාලීන ණය ගැනීම්	**17**	**8,332,827**	134,183,223
බැංකු අයිරා	**18**	**1,361,705**	986,112
මුළු ජංගම බැඳීම්		**565,098,012**	**613,618,605**
මුළු බැඳීම්		**1,043,890,389**	**1,054,429,223**
මුළු හිමිකම් සහ බැඳීම්		**1,353,985,121**	**1,404,970,130**

ඊ. ඒ. ඩෙලිල්කන් මහතා
මූල්‍ය අධ්‍යක්ෂ (වැඩ බලන)

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් 2024-07-04 දින කොළඹ 07, තුම්මුල්ල ලක්සලේ පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අත්සන් කරන ලදී.

ආර්.කේ.එල්. ජාගොඩ මිය	ඩී. ජීවනාදන් මයා	කුෂාන් මාරඹගේ මයා
මණ්ඩල සාමාජික	**මණ්ඩල සාමාජික**	**සභාපති**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය
2023 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රාග්ධන සංචිත	ප්‍රත්‍යාගණන සංචිත	ප්‍රාග්ධන ප්‍රදාන	රඳවා ගත් ඉපැයීම්	මුළු හිමිකම්
	රු.	රු.	රු.	රු.	රු.	රු.
2022 ජනවාරි 1 වන දිනට ශේෂය	69,628,878	510,806	454,366,157	107,951,172	(184,017,430)	**448,439,583**
පෙර වසරේ දෝෂ වලට ගැලපීම්	-	-	-	-	1,141,993	**1,141,993**
වර්ෂය සඳහා ලාභය					(99,040,670)	**(99,040,670)**
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**69,628,878**	**510,806**	**454,366,157**	**107,951,172**	**(281,916,107)**	**350,540,906**
පෙර වසරේ දෝෂ වලට ගැලපීම්					(97,566,464)	**(97,566,464)**
වර්ෂය සඳහා ලාභය	-	-	-		57,120,290	**57,120,290**
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	**69,628,878**	**510,806**	**454,366,157**	**107,951,172**	**(322,362,281)**	**310,094,732**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2023 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා

	සටහන්	2023	2022
මෙහෙයුම් වලින් උපයන මුදල්		රු.	රු.
බදු වියදමට පෙර ලාභය		**57,120,290**	**(99,040,670)**
ගැලපීම් :			
සිදු කරමින් පවතින කටයුතුවල ගැලපීම		45,451,390	
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්		8,401,558	2,827,910
පොලී වියදම්		50,001,511	67,703,833
ක්ෂයවීම්		26,766,077	26,475,424
ඉතිරිකිරීමේ ගිණුම් සඳහා පොලී		(70,513)	(68,432)
ප්‍රාග්ධන වියදම් ක්‍රමක්ෂය		19,303,925	25,590,180
පෙර වසර ගැලපීම්		(97,566,464)	1,141,993
ප්‍රදාන ක්‍රමක්ෂය		(8,824,711)	(15,340,000)
		100,583,063	**9,290,238**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්			
භාණ්ඩ වට්ටෝරු		(40,113,836)	61,364,049
වෙළඳ සහ අනෙකුත් ලැබීම්		6,849,541	16,957,599
වෙළඳ සහ අනෙකුත් ගෙවීම් -		80,211,518	(25,623,168)
මෙහෙයුම් වලින් ඉපයූ මුදල්		**147,530,286**	**61,988,718**
ගෙවන ලද ස්වේච්ඡා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය			
ගෙවන ලද පාරිතෝෂික		(6,779,865)	(2,073,840)
ගෙවන ලද පොලී		(53,258,817)	(67,703,833)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදනය කරන ලද ශුද්ධ මුදල්		**87,491,605**	**(7,788,955)**
ආයෝජන කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ			
ඉතිරිකිරීමේ ගිණුම් සඳහා පොලී		70,513	68,432
දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම්		(1,546,964)	(79,978)
ආයෝජන කාර්යයන් සඳහා භාවිතා කළ ශුද්ධ		**(1,476,451)**	**(11,546)**
මූල්‍ය කාර්යයන්ගේ මුදල් ප්‍රවාහ			
ලබා ගත් දිගු/කෙටි කාලීන ණය		22,617,250	26,030,434
ණය ආපසු ගෙවීම්		(103,282,868)	(2,542,587)
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල්		**(80,665,618)**	**23,487,847**
මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම්/ (අඩුවීම්)		**5,349,537**	**15,687,347**
වසර ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ		52,491,382	36,804,035
වසර අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ		**57,840,919**	**52,491,382**
බැංකු අයිරා	**18**	(1,361,705)	(986,112)
අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල්	**12**	59,202,624	53,477,494
		57,840,919	**52,491,382**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. ආයතනික තොරතුරු

1.0 සමාගම

"ලක්සල" යන වෙළඳ නාමය යටතේ ජනප්‍රියත්වය ලැබ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (SLHB හෙවත් "ලක්සල") ශ්‍රී ලංකාව පුරා නිෂ්පාදනය කරනු ලබන අත්කම් නිර්මාණ අලෙවි කිරීමේ කටයුතුවල යෙදෙන රජය සතු එකම ආයතනය වේ.

1.1 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන් වන්නේ දේශීය සහ විදේශීය වෙළඳපොළට ත්‍යාග සහ සිහිවටන අයිතම අලෙවිකරණය සහ විකිණීමයි.

2. සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.0 ගිණුම්කරණ පදනම

2023 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය,විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමග මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ (මූල්‍ය ප්‍රකාශන) සටහන් ශ්‍රී ලංකා වරළත් ගණකාධිකාරී අයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්වලට (SLFRSs) අනුව සකස් කරන ලදී.

මෙම මූල්‍ය ප්‍රකාශන, සාධාරණ අගය යටතේ මනින ලද මූල්‍ය වත්කම් සහ වගකීම් සඳහා හැරුණු කොට ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇත. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා ඇතැම් තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිත කිරීම අවශ්‍ය වේ. සියළුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇත.

2.1 ගිණුම්කරණ ඇස්තමේන්තු, උපකල්පන සහ නීන්දු භාවිතය

ප්‍රතිපත්ති සහ වාර්තාගත වත්කම් සහ වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රකාශ අදාළ කරගැනීමට බලපාන නීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන ගොඩනැගීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම LKAS (ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත) සහ SLFRSවලට අනුකූලව සිදු කර ඇත. ඇස්තමේන්තු සහ ආශ්‍රිත උපකල්පන ඓතිහාසික පරිචය සහ වෙනත් මූලාශ්‍ර මගින් නොපෙන්වන ඉදිරියට ගෙන ආ වත්කම් සහ වගකීම් වටිනාකම්, නීන්දු ගැනීමේ පදනම සකසන අවස්ථාවල දී ලැබෙන ප්‍රතිඵල යටතේ සාධාරණ යයි විශ්වාස කරන වෙනත් විවිධ සාධක මත පදනම්ව ඇත. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකිය.ඇස්තමේන්තු හා ඉහත කී උපකල්පන ඉදිරියට ගෙනයන පදනම මත සමාලෝචනය කර ඇත. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සංශෝධන, ඇස්තමේන්තු සංශෝධනය කරන කාලය තුල දී එකී සංශෝධන එකී කාලය සඳහා පමණක් හෝ සංශෝධනය කරන කාලයේදී සහ අනාගතයේදී බලපාන්නේ නම් හෝ වර්තමාන සහ අනාගත යන කාල දෙකම සඳහා බලපාන්නේ නම් හෝ එකී කාල තුලදී හඳුනාගෙන ඇත.

2.2 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී, අපේක්ෂා කළ හැකි අනාගත කාලයක් අඛණ්ඩව පවත්වාගෙන යාමට සංවිධානය සතු වගකීම පිළිබඳව අපි තක්සේරුවක් කර ඇත්තෙමු. අනාගතය පිළිබඳ පවතින සියලු තොරතුරු සැලකිල්ලට ගනිමින්, ඈවර කිරීමේ හෝ වෙළඳාම නතර කිරීමේ අවශ්‍යතාවයක් අපි අපේක්ෂා නොකරමු.

2.3 සන්සන්දනාත්මක තොරතුරු

සමාගම විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති නිරතුරුව ක්‍රියාවට නංවා ඇති අතර පෙර වසරේ භාවිතා කළ ප්‍රතිපත්තිවලට අනුකූල වන අතර අවශ්‍ය අවස්ථාවන්හි දී සාධාරණ ඉදිරිපත් කිරීම සඳහා නැවත වර්ගීකරණය කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ආ) ක්ෂය වීම

ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලයට එරෙහිව ලියා හැරීම සඳහා වන ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ සින්නක්කර ඉඩම් හැර සියලු දේපල, පිරියත සහ උපකරණ පිරිවැය මත සරල රේඛා ක්‍රමයක් භාවිතා කරමිනි.

භාවිතා කරනු ලබන ප්‍රධාන අනුපාත පහත පරිදි වේ.

1. ගොඩනැගිලි	2.5%
2. යන්ත්‍රෝපකරණ	10%
3. ඉන්වෙන්ට්‍රි ද්‍රව්‍ය	10%
4. ගෘහ භාණ්ඩ	10%
6.පරිගණක දෘඪාංග සහ මෘදුකාංග	20%

*2018 වසර දක්වා පරිගණක අයිතමවල ක්ෂයවීම් සිදු කරනු ලැබුවේ සරල රේඛා ක්‍රමයක් භාවිතා කරමිනි. නමුත් මෙම අයිතම වර්ෂ 8කට ඉහතදී මිලදී ගෙන ඇති බැවින් සරළ රේඛා ක්‍රමයට ගණනය කිරීමේදී ක්ෂය කළ අගය, එකතුකළ මුළු අගය ඉක්මවා යන බැවින් 2019 වර්ෂයේදී හීනවන ශේෂ ක්‍රමය භාවිත කිරීමට ලක්සලට සිදු විය. එමගින් 2019 වසරේ සිට හීනවන ශේෂ ක්‍රමය ක්‍රියාත්මක කර ඇත.

ඇ) දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ලාභය / අලාභය.

දේපල, පිරියත සහ උපකරණ කාර්යයෙන් බැහැර කිරීමෙන් හෝ අපහරණය කිරීමෙන් වන යම් ලාභයක් හෝ පාඩුවක් විකිණීම සිදුවන කාලසීමාව තුල හඳුනාගන්නා අතර එය වෙනත් මෙහෙයුම් ආදායම් ලෙස වර්ගීකරණය කරයි.

(ඈ) ප්‍රදාන ක්‍රමක්ෂය අනුපාතිකය සහ ගොඩනැගිලි සංවර්ධන වියදම් ක්ෂයවීම හරහා ලාභයට හා අලාභයට අනවශ්‍ය ආදායමක් හෝ වියදම් පැමිණීම වැළැක්වන අයුරින් ප්‍රදාන ක්‍රමක්ෂ අනුපාතිකය සහ ගොඩනැගිලි සංවර්ධන වියදම් ක්ෂයවීම් ඒ අනුව සකස් කර ඇත.

2.4.3 නොනිමි ප්‍රාග්ධනය

වර්ෂය තුළ දරන ලද,මූල්‍ය ප්‍රකාශ දිනට සම්පූර්ණ කර නොමැති ප්‍රාග්ධන වියදම්, අත්තිකාරම් ගෙවීම් ලෙස පෙන්වනු ලබන අතර, වර්ෂ අවසානයේදි සම්පූර්ණ කර ඇති ප්‍රාග්ධන වත්කම් භාවිතයට ගත් වර්ෂය අවසානයේ දේපල, පිරියත සහ උපකරණ වෙත මාරු කර ඇත.

2.4.4 අස්පෘශ්‍ය වත්කම්

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය විසින් අත්පත් කර ගන්නා ලද නිශ්චිත ප්‍රයෝජ්‍ය ආයු කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම්, පිරිවැය අඩු කළ සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි පාඩු මත මනිනු ලැබේ.

අ) හඳුනාගැනීමේ පදනම

වත්කම්වලට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමට සම්භාවිතාවක් ඇත්නම් සහ පිරිවැය අඩු සමුච්චිත ක්‍රමක්ෂ සහ සමුච්චිත හායන පාඩු යටතේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනා ගැනේ.

ආ) පසු කාලීන වියදම්

පසු කාලීන වියදම් ප්‍රාග්ධනීකරණය වන්නේ එය අදාළ වන නිශ්චිත වත්කම්වල අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි කරන විට පමණි. අභ්‍යන්තරව ජනනය කරන ලද වියදම් කීර්ති නාමය සහ සන්නාම ඇතුළු අනෙකුත් සියලුම වියදම්, ආදායම් ප්‍රකාශනයේ දරන ලද ලෙස පිළිගැනේ.

ඇ) කාර්යයෙන් බැහැර කිරීම සහ අපහරණය

අපහරණය කිරීමේදී හෝ අපහරණයෙන් පසුව භාවිතයෙන් අපේක්ෂා කරන අනාගත ආර්ථික ප්‍රතිලාභ නොමැති විට අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා නොගනී.

ඈ) ක්‍රමක්ෂය කිරීම

අස්පෘෂ්‍ය වත්කම් භාවිතය සඳහා පවතින දින සිට ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය මත සරළ රේඛීය ක්‍රමයට ආදායම් ප්‍රකාශය තුළ ක්‍රමක්ෂය කිරීම හඳුනා ගැනේ.

2.4.5 භායනය

වත්කම් භායනය පිළිබඳ කිසියම් ඇඟවීමක් තිබේ ද යන්න තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයෙහි වත්කම් ප්‍රමාණය එක් එක් මූල්‍ය ප්‍රකාශන ශේෂ පත්‍ර දිනයන්හි දී සමාලෝචනය කෙරේ. එවැනි කිසියම් ඇඟවීමක් තිබේ නම්, වත්කමේ ප්‍රතිස්ථාපන වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ඉදිරියට ගෙන යන වටිනාකම හෝ එයින් උත්පාදන කළ හැකි මුදල, එහි ප්‍රතිස්ථාපන වටිනාකම ඉක්මවන විටක භායන අලාභයක් හඳුනාගනු ලැබේ. ආදායම් ප්‍රකාශය තුළින් භායන පාඩු හඳුනා ගනු ලැබේ.

2.4.6 වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ

වෙළඳ ලැබීම් යනු සාමාන්‍ය ව්‍යාපාරයේ දී විකුණන ලද භාණ්ඩ හෝ සේවා සඳහා ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු මුදල්ය. වසරක් හෝ ඊට අඩු කාලයකින් එකතු කිරීම අපේක්ෂා කරන්නේ නම් (හෝ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ ඊටත් වඩා දීර්ඝ වන්නේ නම්), ඒවා ජංගම වත්කම් ලෙස වර්ග කෙරේ. එසේ නොමැති නම්, ඒවා ජංගම නොවන වත්කම් ලෙස ඉදිරිපත් කෙරේ.

2.4.7 භාණ්ඩ තොග

භාණ්ඩ තොග, නියත සහ අළුත්වැඩියා කළ හැකි අයිතම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමෙන් අනතුරුව පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු වටිනාකමට අගය කරනු ලැබේ. පිරිවැය, බරතැබූ සාමාන්‍ය පිරිවැය ක්‍රමය භාවිතයෙන් තීරණය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතරතුරදී තොගය විකිණිය හැකි මිල වේ.

2.4.8 මුදල් සහ මුදලට සමාන දෑ

අතැනි මුදල් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණු සඳහා මුදල් බවට පහසුවෙන් පරිවර්තනය කළ හැකි කෙටි කාලීන ඉහළ ද්‍රවශීලී ආයෝජන, මුදල් හා මුදලට සමාන දෑ ලෙස අර්ථකථනය කරන අතර අතැති මුදල් හා ඉතිරි ශුද්ධ බැංකු අයිරා, කෙටි කාලීන ණය සහ කෙටි කාලීන ආයෝජන මුදල් සහ මුදලට සමාන දෑ ලෙස සැළකේ.

2.4.9 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) අංක 07- මුදල් ප්‍රවාහ ප්‍රකාශ අනුව චක්‍ර ක්‍රමය භාවිත කරමින් සකස් කර ඇත.

2.4.10 සේවක ප්‍රතිලාභ

අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ වන විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම සඳහා වන වගකීම, 2023 කාලපරිච්ඡේදය තුල ආයතනයේ සේවකයන් 108 දෙනෙකු ආවරණය කරනු ලබන නිශ්චිත වූ ප්‍රතිලාභ සැලැස්මකි. මෙම වගකීම සම්පූර්ණ කිරීම සඳහා සෑම සේවකයකුගේ ම සේවය ආරම්භ කළ පළමු වර්ෂයේ සිට සම්පූර්ණ කරන සෑම වර්ෂයක් සඳහා ම අදාළ මූල්‍ය වර්ෂයේ අවසාන මාසයේ වැටුපෙන් අඩක් මත පදනම් ව ගණනය කළ මුදලට සමාන වෙන් කිරීමක් මූල්‍ය ප්‍රකාශයේ දිනට ඉදිරියට ගෙනයනු ලැබේ. වර්ෂය ආරම්භයේ ඉදිරියට ගෙන ආ වෙන්කිරීම් සහ වර්ෂය අවසානයේ ඉදිරියට ගෙන ගිය වෙන් කිරීම් අතර වෙනස විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ සළකා බලනු ලැබේ.

ආ) නිශ්චිත දායකත්ව සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල

අදාළ ව්‍යවස්ථා සහ නියෝග අනුව සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය සහ සේවා නියුක්තියන්ගේ භාර ආරමුදලට දායකත්වය සඳහා සේවකයන් සුදුසුකම් ලබයි. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය සේවකයන්ගේ පූර්ණ සේවා නියුක්තිය මත සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාර අරමුදලටපිළිවෙලින් 12% සහ 3%ක දායකත්වයක් දක්වයි.

2.4.11 ණය ගැනීම්

ණය ගැනීම් මූලිකව, සාධාරණ අගය, ගණුදෙනුවල පිරිවැයේ ශුද්ධ අගයට හඳුනාගනු ලැබේ. පසුගිය කාලවලදී ණය ගැනීම් මිල සඳහන් කරනු ලැබුවේ සඵල පොලී ක්‍රමය භාවිත කරමින් නිලව් කළ පිරිවැයටය. එම කටයුත්තේ යම් වෙනසක් (ශුද්ධ ගණුදෙනු පිරිවැය) සහ ණය නිදහස් කිරීමේ වටිනාකම ණය ගැනීම් කළ කාලය තුල ආදායම් ප්‍රකාශය තුල හඳුනාගනියි.

2.4.12 බැරකම් සහ ප්‍රතිපාදන

අතීත සිද්ධින්වල ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන නෛතික/සාධනීය බැඳීමක් පවතින විට බැරකම් සහ ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල පිළිගනු ලබන අතර, ඒවා පියවීම තුලින් ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් පිටතට ගලා යාම අපේක්ෂා කෙරේ. මූල්‍ය ප්‍රකාශන දින සිට වර්ෂයක් ඇතුළත ණය හිමියන්ගේ ඉල්ලීම පිට ගෙවිය යුතු බැඳීම් මූල්‍ය ප්‍රකාශනවල ජංගම බැරකම් ලෙස සැළකේ. මූල්‍ය ප්‍රකාශන දින සිට වර්ෂයක් ඇතුළත ගෙවිය යුතු බැරකම් මූල්‍ය තත්ත්ව පිළිබඳ විස්තීරණ ප්‍රකාශනයේ ජංගම නොවන බැරකම් ලෙස සැළකේ.

අ) වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුල සැපයුම්කරුවන් වෙතින් ලබා ගත් භාණ්ඩ හා සේවා සඳහා ගෙවීමට බැඳී සිටින මුදල් ගෙවිය යුතු වෙළඳ ගෙවිය යුතු දෑ වේ.ගෙවීම වර්ෂයක් හෝ ඊට අඩු කාලයක් තුලදී (දීර්ඝ ව්‍යාපාර කටයුත්තකදී නම් සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුල) ගෙවිය යුතු වේ නම් එම ගෙවිය යුතු ගිණුම් ජංගම බැරකම් ලෙස වර්ග කෙරේ. එසේ නොවේ නම් ඒවා ජංගම නොවන බැරකම් ලෙස ඉදිරිපත් කෙරේ.

නියෝජන තොග ඇතුළුව සියළු මිලදී ගැනීම් සඳහා භාණ්ඩ ලැබීමේ පත්‍ර රැස් කිරීමේ අවස්ථාවේ ගිණුම් පොත්වල වගකීම් වාර්තා කිරීමේ ප්‍රතිපත්තිය ලක්සල අනුගමනය කර තිබුණි. කෙසේ වෙතත්, තොග ණය හිමියන්ට ගෙවීම් කරනු ලබන්නේ අදාළ තොග තොග අලෙවි කරන විට පමණි.

2.4.13 ආදායම් බදු

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය මෙහෙයුම් කටයුතු සහ උපයනු ලබන බදු අය කළ හැකි ආදායම් සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශන ඉදිරිපත් කරන දිනට මෙරට පනවා ඇති හෝ සරසවන්මහාව පනවා ඇති බදු නීතිය මත පදනම්ව වර්තමාන ආදායම් බදු ගාස්තු ගණනය කරයි. අදාළ බදු නීතිගතකය අර්ථ නිරූපණයට යටත් වන අවස්ථා සම්බන්ධයෙන් බදු වාර්තාවල තත්ත්වයන් කළමනාකරණය වරින් වර ඇගයීමට ලක් කරයි. බදු අධිකාරිය වෙත ගෙවීමට අපේක්ෂිත මුදල් මත පදනම්ව අවශ්‍ය අවස්ථාවලදී ප්‍රතිසාදන සළසයි.

හංඬේ වික්කිණීම්

හංඬේ විකුණුම් ආදායම්, ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිලාභ, වෙළඳ වට්ටම් සහ ප්‍රමාණ වට්ටම් පිළිබඳ ප්‍රතිපත්තියෙන් සංවරණ අඟයට මනිනු ලැබේ. හිමිකාරිත්වයේ සුවිශේෂී අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරුට මාරු වී ඇති, ප්‍රතිඵලයට අයකර ගැනීමට හැකි, ආර්ථික පිරිවැය සහ හංඬේවල විභව්‍ය ප්‍රතිලාභ විශ්වාසනීයව ඇස්තමේන්තු කළ හැකි යන හංඬේ පිළිබඳ කළමනාකරණයේ සම්බන්ධයක් තෘප්තිමත් අවස්ථාවක ආදායම් හඳුනාගනු ලැබේ. අවදානම සහ ප්‍රතිලාභ මාරු වීම් හංඬේ විකිණීමේ ගිවිසුමේ ප්‍රද්ගලික නියමයන් අනුව වෙනස් වේ.

වෙනත් මෙහෙයුම් ආදායම්

අ) දේපල පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ලාභය සහ පාඩුව

ආ) දේපළ , පිරියත සහ උපකරණ කාර්යකෘත් කැහැර කිරීම හෝ අපහරණය කිරීම මත ලාභ හෝ පාඩු විකිණීම් සිදු කළ කාල පරිච්ඡේදය තුල හඳුනාගන්නා අතර වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ වර්ගීකරණය කරනු ලැබේ.

ලැබිණු ප්‍රදාන

විදේශ සම්බන්ධතයන් රජය ප්‍රදාන ලබා දෙන්නේ නම්, එය සිලුවී කිරීමට අදහස් කරන පිරිවැයට ගැලපීම් සඳහා අවශ්‍ය කාල පරිච්ඡේදය තුල ආදායමක් ලෙස හඳුනා ගනියි. ප්‍රදානය වත්කමක් සම්බන්ධයෙන් එනා අවස්ථාවක, සංධාරණ අගය වීලම්බිත ආදායම් ගිණුමකට බැර කර අදාළ වත්කමේ අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා සමාන වාර්ෂික වාරික මඟින් ආදායම් ප්‍රකාශයට නිදහස් කරනු ලැබේ.

ලැබිණු ප්‍රාග්ධන ප්‍රදාන

ලැබිණු ප්‍රාග්ධන ප්‍රදාන විලම්බිත ආදායමක් වශයෙන් හඳුනාගනන වසර 10 ක කාලසීමාවක් තුළ ක්‍රමික්ෂය කරනු ලැබේ.

ලැබිණු ප්‍රතිපූරණ ප්‍රදාන

ආදායම සම්බන්ධ ප්‍රදාන 'මෙහෙත් ආදායම්' වශයෙන් වෙනමම වාර්තා කිරීම හෝ අදාළ වියදම්වලින් අඩු කිරීම කරනු ලැබේ.

2.4.14 වියදම් හඳුනාගැනීම

දරන ලද පිරිවැය සහ විශේෂිත ආදායම් අයිතමයන්ගේ ඉපයීම් අතර යම්කිසි සම්බන්ධය පදනම් කරගනිමින් ආදායම් ප්‍රකාශයේ වියදම් හඳුනාගනු ලැබේ. ව්‍යාපාර කටයුතු තුළදී සහ සේවය, පිරියත සහ උපකරණ කාර්යක්ෂමව නඩත්තු කිරීමෙදී උද්භව වන සියළු වියදම් ආදායම් ප්‍රකාශයට ආරෝපණය කර ඇත.

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා සමාගමේ සහ සම්බන්ධයේ කාර්ය සාධනයේ අංග සාධාරණ ලෙස ඉදිරිපත් කරන පදනම මත, "වියදම් ශ්‍රිත" ක්‍රමය අනුගමනය කර ඇත.

අ) පුනරාවර්තන වියදම්

ආදායම් ප්‍රකාශයේ දක්වා ඇති පරිදි මණ්ඩලය විසින් උපයා ඇති ලාභය සියළුම ප්‍රකාශිත වගකීම් සඳහා සහ දේපළ පිරියත සහ උපකරණ ක්ෂය සඳහා වෙන් කිරීම් කළ පසුව ඉපයූ ලාභ වේ.

ආ) ප්‍රාග්ධන වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා හෝ ව්‍යාපාරයේ ඉපැයීම් ධාරිතාව වැඩි කිරීමේ අරමුණින් ස්ථිර ස්වභාවයේ වත්කම් පුළුල් කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරන ලද වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සැළකේ.

දේපළ, පිරියත සහ උපකරණ අපහරණය කිරීම මත ආදායම් ස්වභාවයේ ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශයේ ගිණුම්ගත කර ඇත.

2.4.15 ණය ගැනුම් පිරිවැය

ණය ගැනුම් පිරිවැය ඒවා දරණ ලද වර්ෂය තුලදී වියදමක් වශයෙන් හඳුනාගනු ලැබේ.

2.4.16 බැඳීම් සහ අවිනිශ්චිතතා

අවිනිශ්චිතතා යනු අතීත සිද්ධීන් මගින් පැන නගින ලද සහ මණ්ඩලයේ පාලනයෙන් බැහැර අනාගත අවිනිශ්චිත සිද්ධියක් ඇති වීම හෝ ඇති නොවීම මත පමණක් නිශ්චය කරගනු ලබන විභව්‍ය වත්කම් හෝ බැඳීම් වේ.

2.4.17 ශේෂ පත්‍ර දිනට පසුව පැන නගින සිද්ධීන්

සියළුම වැදගත් පශ්චාත් ශේෂ පත්‍ර සිද්ධීන් අදාළ අවස්ථාවන්හි දී අනාවරණය කර ගළපා ඇතියි යනුවෙන් සළකා ඇත.

3. ආදායම	**2023**	**2022**
	රු.	රු.
ප්‍රදර්ශනාගාරවල අලෙවිය		
තුම්මුල්ල	314,244,629	123,515,057
කෞතුකාගාරය	-	18,066,992
ගාල්ල	55,717,125	22,808,891
පේරාදෙණිය	74,964,140	17,655,278
කටුනායක	55,678,612	32,888,767
කොටුව	25,486,840	10,614,864
වැලිපැන්න 1	-	7,922,129
බත්තරමුල්ල	19,498,538	9,514,277
මහනුවර	26,639,196	10,732,566
කටුබැද්ද	15,487,215	7,929,004
පින්නවල	20,431,048	5,873,549
නුවරඑළිය	3,611,477	1,530,948
මුළු ප්‍රදර්ශනාගාර විකුණුම්	611,758,820	269,052,322
විදේශීය විකුණුම්-(Sala Global Village)	13,531,063	
සෘජු/පාරිභෝගික රුචිය අනුව කළ ඇණවුම්	15,986,714	14,570,726
	641,276,597	**283,623,048**
ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT)	-	-
	641,276,597	**283,623,048**

4. ආයෝජන		
ඉතිරිකිරීමේ ගිණුමේ පොලී	70,513	68,432

5. වෙනත් ආදායම්	**2023**	**2022**
	රු.	රු.
කුලී ආදායම	13,165,076	20,174,168
ප්‍රදාන ක්‍රමක්ෂය ආදායම	8,824,711	15,340,003
අනුග්‍රාහකත්වය	1,750,000	-
සංචාරක බංගලා වෙන් කිරීම	-	-
විදේශ විනිමය ලාභය	(6,500)	990,762
	23,733,287	**36,504,933**

6. පරිපාලන වියදම්	සටහන්	**2023** රු.		**2022** රු	
වැටුප් සහ දීමනා *		67,949,878		71,541,865	
දිරි දීමනාව		4,456,555		-	
ඊ.පී.එෆ්. සහ ඊ.ටී.එෆ්. (E.P.F. & E.T.F.)		8,367,900		9,199,595	
පාරිතෝෂිකය		8,401,558		2,827,910	
ප්‍රවාහන දීමනාව		9,838,635		9,524,741	
අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු සහ මණ්ඩල රැස්වීම් වියදම්		641,904		454,625	
විගණන ගාස්තු/වෘත්තීය ගාස්තු		975,000		900,000	
නීති ගාස්තු		602,500		264,500	
ආරක්ෂක ගාස්තු		10,815,284		9,157,393	
කුලී සහ වරිපනම් *		22,021,792		19,679,069	
විදුලිය		11,353,395		7,624,906	
ක්ෂය වීම		26,766,077		26,475,424	
ගොඩනැගිලි සංවර්ධන ක්‍රමක්ෂ කිරීම-Exp		19,303,925		25,590,180	
පිරිසිදු කිරීමේ සේවා		7,084,036		6,039,163	
අනෙකුත් කාර්ය මණ්ඩල පිරිවැය *	**6.1**	13,935,267		7,210,644	
වෙනත් මෙහෙයුම් පිරිවැය *	**6.2**	41,428,881		21,726,395	
			253,942,587		**218,216,410**

උප සටහන 6.1

අනෙකුත් පිරිවැය යටතේ ඇතුළත් වේ *	**2023** **LKR**		**2022** **LKR**	
අතිකාල	4,401,033		1,879,207	
සේවක සුබසාධක	5,159,026		3,000,638	
මුදල් ආරක්ෂණ පොලී	196,686		206,347	
කාර්යමණ්ඩල පුහුණුව	1,505,070		53,200	
වෛද්‍ය වියදම්	2,043,654		2,071,252	
ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමය (VRS)	-		-	
		13,935,267		**7,210,644**

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

උප සටහන 6.2 වෙනත් මෙහෙයුම් පිරිවැය යටතේ ඇතුළත් වේ *	**2023** රු.		**2022** රු.	
SSCL බදු වියදම්	8,016,785		989,444	
වෙළඳ දැන්වීම්	680,475		445,973	
මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය	3,797,019		2,083,958	
පුවත්පත් සහ වාර සඟරා	200		-	
තැපැල් ගාස්තු/දුර/ටෙලෙක්ස්	8,677,683		9,012,214	
ඉන්ධන සහ ලිහිසි තෙල්	1,540,225		1,936,575	
තොග සත්‍යාපනය	218,270		20,460	
වෙළඳ බලපත්‍ර ගාස්තු	457,488		479,620	
පරිගණක වියදම්	1,088,485		138,057	
රක්ෂණය	163,828		138,980	
ජල බිල්පත	1,446,809		413,000	
අලුත්වැඩියාව සහ නඩත්තුව - ගොඩනැගිලි	3,353,650		990,980	
අලුත්වැඩියාව සහ නඩත්තුව - යන්ත්‍රෝපකරණ	1,328,348		1,617,899	
වාහන කුලියට දීමේ ගාස්තු	4,301,850		768,392	
පරිවර්තන ගාස්තු	141,529		49,150	
සාමාජික ගාස්තු	4,880		-	
සහන ගාස්තු	6,204,557		2,641,668	
මුද්දර ගාස්තු	6,800		25	
		41,428,881		**21,726,395**

7. විකුණුම් සහ බෙදාහැරීමේ වියදම්	සටහන	**2023**	**2022**
		රු.	රු.
මාර්ගෝපදේශ කොමිස්		30,921,093	8,708,059
ක්‍රෙඩිට් කාඩ් කොමිස්		8,539,603	3,332,395
ඇසුරුම් ද්‍රව්‍ය දේශීය		4,227,403	1,929,021
ව්‍යාපාර ප්‍රවර්ධනය		3,386,068	1,279,581
අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම භාණ්ඩ මිලදී ගැනීම		419,880	143,763
ප්‍රදර්ශනය සහ වෙළඳ ප්‍රදර්ශනය		7,681,447	2,156,125
ගමන් වියදම්		2,641,402	1,897,211
ලියාපදිංචි ගාස්තු		3,400	3,000
තක්සේරු වියදම්		16,620	10,000
රක්ෂණ සහ භාණ්ඩ ප්‍රවාහන ගාස්තු		52,027	74,431
		57,892,687	**19,533,586**

		2023	**2022**
		රු.	රු.
8. මූල්‍ය පිරිවැය			
බැංකු ගාස්තු		297,065	175,210
ණය පොලී	- ලංකා බැංකුව	50,001,511	48,800,009
	- ප්‍රා.ස.බැ.**	-	18,903,824
		50,298,576	**67,879,043**

** ගෙවීම් නොකිරීම හේතුවෙන් ප්‍රා.ස.බැ. ණය ප්‍රතිව්‍යුහගත කරන ලද අතර 2023 වසර සඳහා සාකච්ඡා කළ පරිදි පොලී ගණනය කිරීම සඳහා සහනයක් ලබා දෙන ලද අතර, 2024 සිට ගෙවිය යුතු අඩු කළ පොලී මුදල ඉදිරියට ගෙන යනු ලැබේ.

09. දේපල, පිරියත සහ උපකරණ

		2023	2022
	සටහන්	රු.	රු.
සින්නක්කර වත්කම්	**9.1**	559,500,021	630,170,525
ගොඩනැගිලි සංවර්ධන පිරිවැය	**9.2**	128,135,837	147,439,759
		687,635,857	**777,610,284**

9.1 සින්නක්කර වත්කම්

	ඉඩම්	ගොඩනැගිලි	පිරියත සහ යන්ත්‍රෝපකරණ	ගෘහභාණ්ඩ උපාංග සහ කාර්යාල උපකරණ	පරිගණක උපකරණ	ලිපි	මෘදුකාංග	සිදු වෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු	රු	රු	රු
පිරිවැය හෝ තක්සේරුව									
2022 ජනවාරි **1** දිනට ශේෂය	380,788,639	248,797,761	100,907,491	60,179,729	23,219,066	33,431,623	10,193,250	45,451,390	**902,968,949**
ගැලපීම්		(666,662)							**(666,662)**
එකතු කිරීම්		-	122,500	-	560,990	63,150	-	-	**746,640**
2022 දෙසැම්බර් **31** දිනට ශේෂය	**380,788,639**	**248,131,099**	**101,029,991**	**60,179,729**	**23,780,056**	**33,494,773**	**10,193,250**	**45,451,390**	**903,048,927**
ගැලපීම්								(45,451,390)	**(45,451,390)**
එකතු කිරීම්	-	-	290,274	-	1,114,840	141,850	-	-	**1,546,964**
2023 දෙසැම්බර් **31** දිනට ශේෂය	**380,788,639**	**248,131,099**	**101,320,265**	**60,179,729**	**24,894,896**	**33,636,623**	**10,193,250**	**-**	**859,144,501**
TB සහ Ppe විචලනය	-	-	1	-	-	1		-	
ක්ෂය වීම්									
B2022 ජනවාරි **1** දිනට ශේෂය	-	52,458,185	83,306,401	52,505,798	21,350,182	26,589,162	10,193,250	-	**246,402,978**
වසර සඳහා අය කිරීම	-	6,203,277	10,098,370	6,017,973	809,319	3,346,485	-		**26,475,424**
022 දෙසැම්බර් **31** දිනට ශේෂය		**58,661,462**	93,404,771	**58,523,771**	**22,159,501**	**29,935,647**	**10,193,250**		**272,878,402**
වසර සඳහා අය කිරීම	-	6,203,277	10,121,990	6,017,973	1,066,020	3,356,818	-		**26,766,079**
2023 දෙසැම්බර් **31** දිනට ශේෂය	**-**	**64,864,739**	**103,526,761**	**64,541,744**	**23,225,521**	**33,292,465**	**10,193,250**	**-**	**299,644,481**
ඉදිරියටගෙන ආ ප්‍රමාණයන්									
2022 දෙසැම්බර් 31 දිනට	380,788,639	189,469,637	7,625,220	1,655,958	1,620,555	3,559,126	-	45,451,390	630,170,525
2023 දෙසැම්බර් **31** දිනට	**380,788,639**	**183,266,360**	**(2,206,495)**	**(4,362,015)**	**1,669,375**	**344,158**	**-**	**-**	**559,500,021**

9.2 ගොඩනැගිලි සංවර්ධන වියදම්

	2023	2022
පිරිවැය හෝ සලකන ලද පිරිවැය	LKR	LKR
ජනවාරි 1 දිනට ශේෂය	386,954,261	386,954,261
දෙසැම්බර් 31 දිනට ශේෂය	**386,954,261**	**386,954,261**
ක්‍රමක්ෂය		
ජනවාරි 1 දිනට ශේෂය	239,514,502	213,924,317
වසර සඳහා අය කිරීම	19,303,923	25,590,185
දෙසැම්බර් 31 දිනට ශේෂය	**258,818,425**	**239,514,502**
දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙන ආ ප්‍රමාණ	**128,135,837**	**147,439,759**

9.2 ගොඩනැගිලි සංවර්ධන වියදම් **(සම්බන්ධිතයි)**

ක්‍රමක්ෂය ස්ථානය	වසර	දරන ලද පිරිවැය	අනුපාතය % දශමස්ථාන දෙකකට	2023 ජනවාරි 01 දිනට සමුච්චිත ක්‍රමක්ෂ ශේෂය	2023 තුළ ක්‍රමක්ෂය	2023 දෙසැම්බර් 31 ට සමුච්චිත ක්‍රමක්ෂ ශේෂය	2023 දෙසැම්බර් 31 දිනට රැගෙන ආ ගොඩනැගිලි සංවර්ධන වියදම් ප්‍රමාණය
කෞතුකාගාරය	2013	172,847,765					
කෞතුකාගාරය	2014	1,881,295					
කෞතුකාගාරය	2015	389,178					
එකතුව		**175,118,238**	5.77%	94,152,628.00	10,101,214.00	104,253,842.00	70,864,396.00
බත්තරමුල්ල	2013	117,704,905					
බත්තරමුල්ල	2014	7,119,772					
බත්තරමුල්ල	2015	9,744,208					
එකතුව		**134,568,885**	5.77%	71,122,996.00	7,762,239.00	78,885,238.00	55,683,647.00
පින්නවල	2013	**10,086,000**	10.00%	10,086,000.00		10,086,000.00	-
වාගොල්ල	2014	**810,485**	10.00%	729,438.00	81,048.00	810,485.00	-
පේරාදෙණිය	2013	31,657,965					
පේරාදෙණිය	2014	8,968,352					
පේරාදෙණිය	2015	677,222					
එකතුව		**41,303,539**	10.00%	40,271,260.00	1,032,280.00	41,303,539.00	-
වැලිපැන්න	2013	**10,269,019**	10.00%	10,269,019.00		10,269,019.00	-
තුරහ තරහ පිටිය	2013	**1,113,613**	10.00%	1,113,613.00		1,113,613.00	-
කටුනායක	2013	**1,060,004**	10.00%	1,060,004.00		1,060,004.00	-
උණවටුන	2013	**1,000,004**	10.00%	1,000,004.00		1,000,004.00	-
K-Zone	2013	**8,353,071**	10.00%	8,353,071.00		8,353,071.00	-
තුන්මුල්ල		**769,767**	10.00%	615,830.00	76,977.50	692,807.00	76,960.00
මහනුවර	2019	1,993,423					
ගලපන ලද	2020	508,213					
		2,501,636	10.00%	740,638.50	250,164.00	990,802.50	1,510,833.50
මුලු එකතුව		**386,954,261**		**239,514,502**	**19,303,923**	**258,818,424**	**128,135,837**

10. භාණ්ඩ වට්ටෝරු	**සටහන්**	**2023** රු.	**2022** රු.
ප්‍රදර්ශනාගාර වෙළඳාම ගුණාත්මයෙන් ඉහළම නිමි භාණ්ඩ		349,816,762	328,862,842
ගුණාත්මයෙන් දෙවන නිමි භාණ්ඩ		173,806,680	154,646,764
අමුද්‍රව්‍ය සහ කෙරෙමින් පවතින කාර්යයන්	**10.1**	392,295	392,295
		524,015,737	**483,901,901**

10.1 අමුද්‍රව්‍ය සහ කෙරෙමින් පවතින කාර්යයන්

අමුද්‍රව්‍ය සහ ක්‍රියාත්මක වෙමින් පවතින කාර්යයන් පාරිභෝගික රුචිය අනුව සාදන ලද සෘජු ඇණවුම් සඳහා

11. වෙළඳ සහ අනෙකුත් ලැබීම්	**සටහන්**	**2023** රු.	**2022** රු.
වෙළඳ ලැබීම්	**11.1**	15,080,268	14,930,358
අනෙකුත් ලැබීම්	**11.2**	8,666,539	12,069,562
තැන්පතු සහ පෙරගෙවුම්	**11.3**	59,384,096	62,980,524
		83,130,903	**89,980,444**
11.1 වෙළඳ ලැබිය යුතු			
වෙළඳ ණය ගැනියන්		16,229,979	23,562,897
අඩමාණ ණය ගැනියන්	**11.4**	(9,578,372)	(9,578,372)
ලැබිය යුතු ණයවර පත්		8,428,661	945,833
		15,080,268	**14,930,358**
11.2 වෙනත් ලැබිය යුතු දේ			
කාර්ය මණ්ඩල ණය		122,250	265,000
ලැබිය යුතු කුලිය		8,057,192	11,804,919
ලැබිය යුතු NBT		485,097	
ලැබිය යුතු විවිධ		2,000	(357)
		8,666,539	**12,069,562**
11.3 තැන්පතු සහ පෙරගෙවුම්			
ආරක්ෂක තැන්පතු		50,000	126,022
පෙරගෙවුම්		5,341,392	4,229,119
අත්තිකාරම් ගෙවීම්		42,793,490	35,181,010
රඳවා තබා ගැනීමේ මුදල්		500,000	12,502,564
ආපසු ගෙවිය හැකි තැන්පතු		10,699,214	10,828,714
ලැබිය යුතු ඇපකර		-	113,095
		59,384,096	**62,980,524**

11.4 අඩමාණ ණය ගැනියන්

2018 වර්ෂයේදී පැරණි ශේෂයන් සම්බන්ධයෙන් රු.9,578,372/=ක් සඳහා ප්‍රතිපාදන සම්මත කර තිබුණි.

	2023	2022
	රු.	රු.
12. මුදල් සහ මුදල්වලට සමාන දෑ		
බැංකුවේ ඇති මුදල්	54,357,013	52,051,111
අතැති මුදල්	4,845,611	1,426,383
	59,202,624	**53,477,494**
ආදායම් සංචිතයේ අනෙකුත් සංරචක		
ආරම්භක ශේෂය	(123,399,006)	(124,540,999)
පෙර වසරේ සංශෝධනය	(97,566,464)	1,141,993
	(220,965,470)	**(123,399,006)**

ආදායම් සංචිතයේ ඇති අනෙකුත් සංරචක අතරට සමුච්චිත ආදායම් සංචිත හරහා ප්‍රත්‍යවෙක්ෂණ කර සම්මත කරන ලද පූර්ව කාල පරිච්ඡේදවලට අදාළ සංශෝධන ඇතුළත් වේ.

	2023	2022
	රු.	රු.
13. විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්		
ආරම්භක ශේෂය	57,679,530	56,925,460
වසර සඳහා පාරිතෝෂික ප්‍රතිපාදන	8,401,558	2,827,910
වසර තුළ ගෙවන ලද පාරිතෝෂිකය	(6,779,865)	(2,073,840)
අවසන් ශේෂය	**59,301,223**	**57,679,530**

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සඳහා බැඳීම සංවිධානයේ සේවකයින් 108ක් ආවරණය වන පරිදි නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි.

14.විලම්බිත ආදායම
දීමනාව පිළිබඳ විස්තරය

	වසර	ක්‍රමක්ෂය වීමේ අනුපාතය	ලැබී ඇති මුල් දීමනාව	**2022** දෙසැම්බර් **31** දිනට ක්‍රමක්ෂය නොකළ ශේෂය	**2023** තුළ ක්‍රමක්ෂ කළ මුදල	**2023** දෙසැම්බර් **31** දිනට ක්‍රමක්ෂය නොකළ ශේෂය
ආර්ථික සංවර්ධන	**2012**	10%	100,000,000			
වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය	**2013**	10%	36,000,000			-
අයවැය ප්‍රතිපාදන	**2013**	10%	10,224,643			-
අයවැය ප්‍රතිපාදන	**2013**	10%	42,109,637	4,210,962	4,210,962	-
අයවැය ප්‍රතිපාදන	**2013**	10%	11,099,920			-
අයවැය ප්‍රතිපාදන	**2013**	10%	7,828,426			-
ආර්ථික සංවර්ධන	**2014**	10%	35,000,000	3,500,000	3,500,000	-
අයවැය ප්‍රතිපාදන	**2014**	10%	11,137,374	1,113,749	1,113,749	-
එකතුව			**253,400,000**	**8,824,711**	**8,824,711**	**-**

	2023	2022
	රු.	රු.
15. දිගුකාලීන ණය ගැනීම්		
ආර්ම්භක ශේෂය	503,616,664	477,586,230
වර්ෂය තුළ ලබාගත් ණය	-	177,076,555
වසර තුළ ගෙවූ ණය	(75,792,683)	(151,046,121)
අවසන් ශේෂය	427,823,981	503,616,664
(අඩු කළා) වසරක් ඇතුළත ගෙවිය යුතු	(8,332,827)	(129,310,287)
දිගුකාලීන ණය බැඳීම්	**419,491,154**	**374,306,377**

15.1 ලංකා බැංකුව - 2023 අවසන් වන විට ණය ශේෂය රුපියල් මිලියන 256.8

ආරම්භයේ දී කොටුව ගොඩනැගිල්ල උකස් කර කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා රුපියල් මිලියන 950 කට 2012 සිට 2018 දක්වා කාලය තුළ ණය ලබා ගන්නා ලදී. ලබාගත් ණය මුදලින් ප්‍රදර්ශනාගාර වැඩි දියුණු කරන අතරම, ලක්සල ණය ගෙවීම සඳහා ආදායමේ සැලකිය යුතු වර්ධනයක් ලබා ගත්තේය. අවසානයේ ප්‍රාග්ධන ණය ප්‍රමාණය පියවූ අතර 2013 වසරේ සිට 2019 දක්වා ලංකා බැංකු ණය රුපියල් මිලියන 273 දක්වා අඩු කෙරිණි. නමුත් රටේ පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් 2020 වසරේ සිට 2023 වසර දක්වා ණය මුදල සහ පොලී පියවීමට ලක්සලට නොහැකි විය. එබැවින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයන ලද පරිදි, 2020 සහ 2023 දී බොහෝ සහන කාල සීමාවන් ලබා ගන්නා ලද අතර, 2023 දී එවකට පැවති මුදල් ප්‍රවාහ තත්ත්වයට ගැලපෙන පරිදි ණය ප්‍රතිව්‍යුහගත කරන ලද අතර, දැනට ඒ අනුව ණය සේවා සපයනු ලැබේ.

15.2 2022 මුදල් වර්ෂය තුළ දැනට පවතින ණය 3 සඳහා අමතර පමා සහන හයක් ලබා දෙන ලදී.

ලංකා බැංකුවේ ණය ශේෂය 2021	රු.මි. 306.0
ලංකා බැංකුවේ පොලී සහ ණය මුදල 2022	රු.මි.26.6
ලංකා බැංකුවේ මුළු ණය ශේෂය	**රු.මි. 332.6**
2023 ලංකා බැංකුවට ගෙවන ලද ණය මුදල	රු.මි. 75.8
ලංකා බැංකුවේ මුළු ණය ශේෂය	**රු.මි. 256.8**

15.3 ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - රු.මි.200

හදිසි කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා 2013 වසරේදී කැලණිය ග්‍රාමීය සංවර්ධන බැංකුවෙන් රුපියල් මිලියන 200 ක පහසුකමක් ලබා ගන්නා ලදී. මහා භාණ්ඩාගාරය බැංකුව හරහා ණය පහසුකම සකස් කර ඇති බැවින් ලක්සල විසින් කිසිදු ඇපකරයක් ලබා දී නොමැත. 2021 වසරේදී COVID-19 වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස ඇති වූ මූල්‍ය තත්ත්වය හේතුවෙන් පොලිය ප්‍රාග්ධනීකරණය කරන ලද අතර 2023 කාලපරිච්ඡේදය තුළ සිදු කරන ලද කපා හැරීමක් සමඟ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සිදු කෙරෙමින් පවතී.

	2023	2022
	රු.	රු.
16. වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දේ		
වෙළඳ ගෙවිය යුතු	329,473,485	255,675,927
වෙනත් ගෙවිය යුතු	115,368,931	112,832,631
උපචිත වියදම්	90,162,578	88,142,226
	535,004,994	**456,650,784**
17. කෙටි කාලීන ණය ගැනීම්		
දිගුකාලීන ණය බැඳීම්වල වත්මන් කොටස	8,332,827	129,310,287
කෙටි කාලීන ණය	0	2,330,348
	8,332,827	**131,640,635**

	2023	2022
	රු.	රු.
18. බැංකු අයිරා		
බැංකු අයිරා	**1,361,705**	**986,112**

රුපියල් 1,361,705.00 (2021: රුපියල් 986,112.00) බැංකු අයිරාව වසර අවසාන වන විට මුදල් පොතේ දිස්වන ශේෂයයි. මූල්‍ය වර්ෂයේ ලංකා බැංකුවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමත් සමඟ රුපියල් මිලියන 15ක අයිරා පහසුකම සඳහා බැංකුව විසින් අනුමැතිය ලබා දෙන ලදී.

19. අවිනිශ්චිත වගකීම් සහ බැඳීම්

මණ්ඩලයට එරෙහිව විභාග වෙමින් පවතින නඩු:

උසාවි අංක	නඩුව ගොනු කළේ:	නඩුව ගොනු කරනු ලැබුවේ	නඩුවේ ස්වභාවය	වත්මන් තත්ත්වය
DMR/0280/13	2015 ජූලි 13	කෝට්ටේ මහ නගර සභාව	සූර්ය පැනල සවිකිරීමේ කොන්ත්‍රාත්තුව උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් ලක්සලට එරෙහිව කෝට්ටේ මහ නගර සභාව විසින් දිසා අධිකරණයේ ගොනුකළ නඩුව	රු. 4,020,000ක් පොලිය සමඟ කෝට්ටේ මහ නගර සභාවට ගෙවීමට තීරණය විය. කෙසේ වෙතත් මෙම නඩුවට අදාළව ලක්සල ආයතනය විසින් අභියාචනයක් ඉදිරිපත් කර ඇත. අධිකරණ තීන්දුව ලබා දුන් බැවින්, 2023 දෙසැම්බර් 31 වන විට ගෙවිය යුතු මුදලට සමාන මුදලක් ලබා දෙන ලදී
DMR/2255/16	2016 මැයි 9	ඩිමෝ පුද්. සමාගම	ඉතිරි මුදල් නොගෙවා කොන්ත්‍රාත්තුව උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් ලක්සලට එරෙහිව ඩිමෝ විසින් දිසා අධිකරණයේ ගොනු කරන ලද නඩුව.	තීරණය තවමත් ලබා දී නොමැති අතර 2023 දෙසැම්බර් 31 වන දිනට කිසිදු සසම්භාව් බැඳීමක් නොපවතී.
138/2018/MR	2018 මාර්තු 8	JAT හෝල්ඩිංග්ස් පුද්. සමාගම	ලක්සල විසින් සංචාරක මණ්ඩලයෙන් ලබාගෙන JAT හෝල්ඩිංග්ස් වෙත උප කොන්ත්‍රාත්තුවක් ලබා දී ගෙවීමට ඇති රු. 8,184,683.49 ක ගෙවීමක් සම්බන්ධයෙන් කොළඹ වාණිජ මහාධිකරණයේ ගොනු කරන ලද නඩුව.	ලක්සල (SLHB) වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව විරෝධතා ඉදිරිපත් කර ඇත.
139/2018/MR	2018 අප්‍රේල් 10	JAT හෝල්ඩිංග්ස් පුද්. සමාගම	ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ 22 වැනි මහලේ පිහිටි බේරුම්කරණ මධ්‍යස්ථානය (Arbitration centre) ප්‍රතිසංස්කරණය කිරීමට ලක්සල අධිකරණ අමාත්‍යාංශය සමඟ ගිවිසුමක් අත්සන් කර ඇත. ලක්සල මෙය JAT හෝල්ඩිංග්ස් සමාගමට උප කොන්ත්‍රාත්තුවක් මගින් ලබා දී තිබූ අතර වැඩ අවසන් කර ඇත. නමුත් අධිකරණ අමාත්‍යාංශය JATහෝල්ඩිංග්ස් වෙත ගෙවිය යුතු ඉතිරි මුදල් පියවා තිබුණේ නැත. එබැවින් රුපියල් 32,256,980 ක මුදලක් නොගෙවීම සම්බන්ධයෙන් ලක්සලට එරෙහිව JAT හෝල්ඩිංග්ස් විසින් කොළඹ මහාධිකරණයේ නඩුවක් පවරා ඇත.	ලක්සල (SLHB) වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව විරෝධතා ඉදිරිපත් කර ඇත.

අභ්‍යන්තර විමර්ශන

2015 වසරේ වැඩ තහනම් කර ඇති ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකුට එරෙහිව අභ්‍යන්තර විමර්ශන පැවැත්විණි.
අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය ලැබීමට නියමිතය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } IMT/B/SLHB/237/2023/FS ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2024 දෙසැම්බර් 05 දින

සභාපති
ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති.

පිටපත් :-
1. ලේකම් - කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
2. ලේකම් - මුදල්, සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. IMT/B/SLHB/237/2023/FS ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2024 නොවැම්බර් 01 දින

සභාපති

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 12 හි 12, 46, 58 හා 77 ඡේද ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් බදු ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සේවිකාවන් දෙදෙනෙකු විසින් මණ්ඩලයට එරෙහිව පවරන ලද නඩු දෙකක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 හි 84 ඡේදය අනුව හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති ශේෂය රු.16,229,979 ක් වූ අතර ඉන් වර්ෂ 3 ත් 12 ත් අතර පවතින රු.11,864,738 ක අයකර ගැනීමට නොහැකි ණයගැති ශේෂ සඳහා ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨ වාර්තාකරණ ප්‍රමිති අංක 9 හි 5.4.4 හා 5.5 ඡේද ප්‍රකාරව බොල්ණය ප්‍රතිපාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2013 වර්ෂයේ දී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් ලබාගන්නා ලද රු.මිලියන 200 ක ණය මුදලින් රු.158,399,824 ක් සහ නොගෙවූ පොලිය සමුච්චිත වීමෙන් ප්‍රාග්ධනිත කරන ලද ණය පොළී ශේෂය රු.12,609,762 ක් 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව පැවතුණු අතර මීට අදාළ රු.18,534,346 ක් වූ සමාලෝචිත වර්ෂයේ පොළිය ගිණුම්ගත කර නොතිබුණි. මේ හේතුවෙන් එම වටිනාකමින් ලාභය වැඩියෙන් හා ජංගම වගකීම් අඩුවෙන් දැක්වුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ භෞතික තොග සත්‍යාපනයේදී හඳුනාගත් රු.6,804,182 ක තොග ඌණතාවය ගිණුම්ගත කිරීමට හා පාඩුව ආවරණය සඳහා විධිමත් ක්‍රියාමාර්ගය ගැනීමට කටයුතු කර නොතිබූ අතර එම වටිනාකමින් තොග ශේෂය හා වර්ෂයේ ලාභය වැඩියෙන් දැක්වුණි.

(ඊ) භෞතික තොග නිවැරදිව සත්‍යාපනය නොකිරීම හා තොග සම්බන්ධයෙන් ගිණුම්කරණ පද්ධතියේ පවතින නොසැසඳීම් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් රු.196,543,310 ක් වූ තොගයේ පැවැත්ම විගණනයට තහවුරු කරගත නොහැකි විය.

(උ) සමාලෝචිත වර්ෂය අවසානයට පිරියත හා යන්ත්‍ර සහ ලී බඩු සවිකිරීම් හා කාර්යාල උපකරණ වල ධාරණ අගය පිළිවෙළින් රු.2,206,496 කින් සහ රු. 4,362,015 කින් ඉක්මවා ක්ෂය කර තිබීම හේතුවෙන් දේපළ පිරියත හා උපකරණ වටිනාකම හා ලාභය රු.6,568,511 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.220,031,513 ක් වූ දේපළ පිරියත හා උපකරණ අයිතම 04 ක භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව වටිනාකම රු.64,369,755 ක් වූයෙන් රු.155,661,758 ක් වූ වෙනසට අදාළ සැසඳීම් කර අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකර නොතිබුණි.

(එ) රේස් කෝස් ප්‍රදර්ශනාගාරය සඳහා 2012 වර්ෂයේ නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවන ලද රු.3,701,025 ක තැන්පතු මුදල නැවැත අය නොවන නමුත් ගිණුම්වල ලැබිය යුතු ලෙස දක්වා තිබුණි.

(ඒ) එකඟ වූ බදු ගිවිසුම් 3ක් ක්‍රියාත්මක නොවීම නිසා ගිණුම්ගත කර තිබූ ගිවිසුම්ගත වටිනාකම වූ රු.1,505,000 ක් ලැබිය යුතු ශේෂ තුල වැඩියෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ'කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති 1.2 හි (ඇ), (ඈ) හා (ඊ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමාකිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 21 හා 23 වගන්ති	2015 නොවැම්බර් 19 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ගත් තීරණය පරිදි නිලධාරිනියන් දෙදෙනෙකු වැඩ තහනමකට ලක් කර තිබුණද සමාලෝචිත වර්ෂයේදීද මණ්ඩලයේ විනය බලධරයා විසින් විනය නියෝග ලබා දී නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 396 (ඇ)	රු.444,346 ක් වටිනා චෙක්පත් 27 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ii) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 371(5)	නිලධාරීන් 6 දෙනෙකු විසින් ලබාගෙන තිබූ රු.572,490 ක තත්කාර්යය අත්තිකාරම් දින 30 සිට දින 252 ක් අතර කාල ප්‍රමාදයක් සහිතව පියවා තිබූ අතර නිලධාරීන් 6 දෙනෙකු ලබාගෙන තිබූ රු.483,000 ක අත්තිකාරම් මුදල් ඊළඟ වර්ෂයේ පියවා තිබුණි.
(iii) මුදල් රෙගුලාසි 502 (2) සහ 2009 සැප්තැම්බර් 01 දිනැති හා අංක DMA/2009(2) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය	ස්ථාවර වත්කම් ලේඛනයක් විධිමත්ව නඩත්තු කර නොතිබූ අතර වත්කම් වර්ග 04 කට අදාළව රු.178,345,544 ක මිලදීගැනීම් පිළිබඳ තොරතුරු නිවැරදිව යාවත්කාලීන කර නොතිබුණි.
(ඇ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය	2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 06 ක් ප්‍රමාද වී 2023 අගෝස්තු 5 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණු අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව මෙම වාර්තාවේ දිනය දක්වාම ලබා දීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත

ස්ව තක්සේරු පදනම මත මාසිකව බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවීම් කිරීමට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට රු.6,590,693 ක් තවදුරටත් ගෙවිය යුතුව පැවතුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3. වෙනත් කරුණු

(අ) 2022 වර්ෂයේ ඩුබායි රාජ්‍යයේ පැවති ග්ලෝබල් විලේජ් ප්‍රදර්ශනය සඳහා යවන ලද රු.20,731,487 ක් වටිනා අත්කම් නිර්මාණ සහ මැණික් හා ස්වර්ණාභරණ වලින් රු.7,200,424 ක් වටිනා මැණික් හා ස්වර්ණාභරණ භාණ්ඩ ආපසු එවා තිබුණද එම භාණ්ඩ වරලත් නියෝජිතයා විසින් නැවත මණ්ඩලය වෙත ලබා දී නොතිබුණි. අදාළ ප්‍රදර්ශන අලෙවි වටිනාකම වූ රු.13,531,064 කින් 2024 පෙබරවාරි 05 විගණන දින වන විටත් රු.2,706,213 ක මුදලක් මණ්ඩලයට ලැබී නොතිබුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට පැවත එන ගෙවිය යුතු බදු (ආදායම් බදු, ආර්ථික සේවා බදු, ජාතිය ගොඩනැගීමේ බදු, එකතු කල අගය මත බදු) රු.46,125,572 ක් 2018 හා 2019 වර්ෂ වලට අදාලව ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු රු.1,494,183 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. තවද 2011 සිට 2022 දක්වා මණ්ඩලයේ විගණන කටයුතු වෙනුවෙන් ජාතික විගණන කාර්යාලයට ගෙවිය යුතු විගණන ගාස්තු රු.9,295,157 ක් සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කර නොතිබුණි.

(ඇ) කිසිදු මෙහෙයුම් කටයුත්තක් සඳහා උපයෝජනය නොකර 2009 වර්ෂයේ සිට වසා දමා ඇති කෙසෙල්වත්ත ව්‍යාපෘතිය සතු රු.4,921,120 ක වටිනා යන්ත්‍ර සූත්‍ර හා ගොඩනැගිලි නිශ්කාර්යව පැවතුණු අතර එහි ආරක්ෂාව සඳහාද වාර්ෂිකව රු.1,041,600 ක් වැය කරමින් පැවතුණි.

(ඇ) කොටුව අලෙවි ප්‍රදර්ශනාගාර ගොඩනැගිල්ලෙහි වර්ග අඩි 40,830 ක් පමණ වූ පරිශ්‍රය අබලන් වීම හේතුවෙන් දීර්ඝ කාලයක සිට නිශ්කාර්යව පවතින අතර නවීකරණය කර භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 1991 ජූලි 05 දිනැති හා අංක 670 දරන ගැසට් පත්‍රය මඟින් ගාල්ල අලෙවි ප්‍රදර්ශනාගාරය පිහිටි ඉඩම සහ දෙමහල් ගොඩනැගිල්ල මණ්ඩලය වෙත පවරා දී තිබුණද නීත්‍යානුකූලව හිමිකම ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඊ) කෞතුකාගාර භූමියේ ස්ථාපිත කර තිබී 2023 නොවැම්බර් මස ඉවත් කරන ලද ලක්සල ප්‍රදර්ශනාගාරයේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් මණ්ඩලය දරන ලද වියදම් වෙනුවෙන් කෞතුකාගාර දෙපාර්තමේන්තුවෙන් රු.107,548,197 ක මුදලක් ලැබිය යුතුව පැවතුණද එය මේ දක්වා අයවී නොතිබුණි.

(උ) ගාල්ල උණවටුන සළුසල ආයතනයට අයත්ව තිබූ අක්කර 01 පර්චස් 30.6 ක භූමිය හා ගොඩනැගිලි 2012 ඔක්තෝබර් 11 දිනැති හා අංක 12/1523/553/020 දරණ කැබිනට් තීරණය මඟින් මණ්ඩලය වෙත පවරා දී තිබූ අතර ගැනුම් ප්‍රතිඥාව ලෙස සලකා මණ්ඩලය විසින් 2012 වර්ෂයේදී රු15,248,575 ක් ගෙවා තිබුණ ද ලංකා සළුසල ආයතනය මෙම ඉඩම නැවත 2023 සැප්තැම්බර් 22 දින රු.25,000,000 ක මුදලකට කාර්මික සංවර්ධන මණ්ඩලයට පවරා දී තිබුණි. එහිදී ආයතනය ගැනුම් ප්‍රතිඥාව ලෙස ගෙවා තිබූ වටිනාකම සළුසල ආයතනයෙන් අයකර ගැනීමට 2024 සැප්තැම්බර් 25 වන දින වන විටත් කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති